14/11/2010 - ඉරිදා ලංකාදීප

**කියුබාවේ වෙනස්කම් අධ්‍යයනයෙන් අපට ඉගෙනගත හැකි පාඩම - මිලින්ද මොරගොඩ**

ජගත් ප්‍රජාව කියුබාව දෙස බලා සිටී. 1959 වසරේ දී විප්ලවයකින් බලයට පත් පිදෙල් කස්ත්‍රෝ අඛණ්ඩව කියුබාව පාලනය කළේය. මුලු ලෝකයම ප්‍රතිසංස්කරණ ගැන කතා කළ නමුත් හෙතෙම නිහඬව ස්වකීය ජනතාව සමග සිටියේය. ආර්ථික හා සමාජ පෙරැළියක් ජාත්‍යන්තර සමාජයේ හමුවේ සිදුවන විට ද හෙතෙම නොසැලෙන බලවේගයක්ව කියුබාව ආරක්ෂා කළේය. අවුරුද්දක් - දෙකක් නොව 2006 වසර දක්වාම ඔහුගේ ධෛර්යය නොසිඳී පැවතිණ. සෝවියට් දේශයේ පෙරොස්ත්‍රොයිකාව සිදුවන විට, චීනයේ ආර්ථික වෙනසක් සිදුවනවිට, ලෝක ආර්ථිකය පසුබෑමට ලක්වන විට තම මවුබිම ට එහි උණුසුම නොදැනෙන්න ඔහු වග බලා ගත්තේය.

මහජනතාවට ගැලපෙන, වඩා සාධාරණ ක්‍රම ඇතත්, විකල්ප බලවේග ලෝකයේ මුහුණුවර වෙනස්කරන බව දකින අතරතුරත් හෙතෙම තව දුරටත් මොනවෘතය ආරක්ෂා කළේය. ඵලදායකත්වය, තරඟකාරීත්වය, පුද්ගලික අංශය, ආයෝජනය වැනි ලෝක ආර්ථිකයේ බෙහෙවින් අවධානයට ලක්වූ මාතෘකා තම රටට ඇතුලු වීම වලකන්නට හෙතෙම උනන්දු විය.

එසේ නමුත් මේ දිනවල කියුබාවේ සිදුවීම් ඔස්සේ ජගත් ප්‍රජාවට අනාවරණය කළ කරුණු රැසකි. කියුබානු ආණ්ඩුවට අයත් රෙදි වෙළඳ සැලක සේවිකාවන් පස්දෙනෙකු සිටී. එහි අලෙවියට ඇති නයිලෝන් ඇඳුමක් ප්‍රදර්ශනයට ඇත්තේ 1960 වසරේ සිටය. දිනකට එකම ඇඳුමක්වත් අලෙවි නොවෙන නමුත් මේ සේවිකාවන්ට රජය වැටුප් ගෙවයි යනුවෙන් මාධ්‍ය වාර්තා කර තිබිණ. 2009 අවුරුද්දේ එරට කෝපි අස්වැන්න ගැන තොරතුරු ප්‍රකාශයට පත්ව තිබේ. 1940 දී ලෝකයේ විශාලතම කෝපි නිෂ්පාදකයා වූ කියුබාව පසුගිය අවුරුද්දේ නිපදවා ඇත්තේ කෝපි ටොන් 5,500 ක් පමණක් වන අතර එය එරට පරිභෝජනයට ද ප්‍රමාණවත් නැත. ඉසුරුමත් යුගයේ දී මුලු ලෝකයේ ම අලෙවි වූ සීනි වලින් තුනෙන් එකක් නැව්ගත කර ඇත්තේ කියුබාවේ වරාය ඔස්සේ බව කියයි. එනමුත් පසුගිය වසරේ කියුබාවේ සීනි නිපැයුම එරට ඉතිහාසයේ වාර්තාගත නරකම නිෂ්පාදනයයි. අකාර්යක්ෂමතාවය හා නොසැලකිල්ල බහුල බව එරට මාධ්‍යම බරපතල ලෙස චෝදනා කරන්නට පටන්ගෙන තිබේ. කලු ආර්ථිකය ගැන එළිපිට කතාකරන්නට පටන් ගෙන ඇත. එරට වැසියන් අතීතයේ සිදුවූ විප්ලවය ගැන අභිමානයෙන් සිහිපත් කරන නමුත් අද ගෙවන ජීවිතය ගැන සතුටක් නැති බව පළකරන අදහස් වලින් හෙළිවෙයි.

මෙවැනි කරුණු නිසා අද කියුබානු පාලනය දුෂ්කරතා ගණනාවකට මුහුණ දී සිටී. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කළ යුතුය. ඒ වෙනුවෙන් ආයෝජනයට අලුත් ආදායම් උපයා ගත යුතුය. සම්ප්‍රදායික නිෂ්පාදන සේවා අංශ බිඳ වැටී තිබේ. අලුතින් සේවා හා ව්‍යාපාර ආරම්භ කරන්නට නම් ප්‍රතිසංස්කරණයක් සිදුවිය යුතුය.

පිදෙල් කස්ත්‍රෝ විප්ලවයක් කළේය. ඒකාධිපති පාලනයෙන් රට මුදවා ගැනීම ඒ විප්ලවයයි. පීඩනයෙන් වෙලී, දුකින් හා සන්තාපයෙන් වෙලී සිටි සමාජය එකී පෙරැළිය සමග මහත් බලාපොරොත්තු සහගතව එකතුවූහ. කියුබානු නායකයා විසින් ඉටු කළේ ඔහුගෙන් විය යුතුව තිබුණ කාර්ය භාරයයි. නිසි අවස්ථාවේ ගන්නට සිදුවූ බැරෑරුම් තීරණයයි. එයින් ඉනික්බිතිව කියුබාව මෙහෙයවිය යුතුව තිබුණ දිසාව වෙනුවට ගමන්කළ මාවතේ තීරණාත්මක කෙළවරට දැන් පැමිණ සිටී. රජය විසින් ජනතාව නඩත්තු කිරීමේ හා ප්‍රාග්ධනයේ හිමිකාරීත්වය ගැන තිබුණ සංකල්ප ගැන අලුතින් සිතන්නට මෙම ගමනක අවසානය විසින් බල කර ඇත. ප්‍රාග්ධනය රජයට පමණක් හිමිවීමේ නැඹුරුව විසින් කියුබාව බරපතල අර්බුදයකට යොමු කර තිබේ. ජනතාව ව්‍යවසායකයන් නොව රජය විසින් ව්‍යවසාය පවත්වාගෙන යමින් ජනතාව නඩත්තු කිරීමේ න්‍යාය තවත් පවත්වාගෙන යා හැකි ද? යන ප්‍රශ්නය තදින් විමසන අවධියට දැන් කියුබාව පැමිණ සිටී.

පිදෙල් කැස්ත්‍රෝ ගෙන් බලය ලබා ගත් රායුල් කස්ත්‍රෝ ජාත්‍යන්තරයේ පවතින යථාර්ථවාදී රාමුව අවබෝධ කරගනිමින් සිටන බව පෙනේ. ජාත්‍යන්තරයේ පවතින චක්‍රයට එපිටින් උඩුගං බලා යා නොහැකි බව ඔහු තේරුම් ගනිමින් ඇත. පවතින යල්පැනගිය තීන්දු වෙනුවට ආර්ථිකය නව ජවයකින් ඉදිරියට ගෙන යාමේ බලවේගය අතට ගන්නට ඔහු තීරණය කරයි. ඒ තීරණය මිහිරි නැත. ආරම්භයේ සිට තමන්ගේ මව්බිම ගමන් කරන දිසාව ඔහු බලා සිටින්නට ඇත. අසල්වැසි රටවල

ජනතාව කතාකරන සෞභාග්‍යය හා සැනසිලිදායක පරිසරය ලඟා කරගන්නේ කෙසේ ද්‍රියි සිතන්නට ඇත. පවතින පැරණි බලවේග සමග ඉදිරියට යාම වෙනුවට අලුත් අදහස් හා ආර්ථිකයේ ප්‍රායෝගික සංකල්ප සමග එකතු වන්නට අවසානයේ දී රායුල් කස්ත්‍රෝ තීන්දු කරන්නට ඇති බව තේරුම්ගත හැකිය.

මේ වසරේ මුල රූපවාහිනියෙන් කතා කළ කියුබාවේ නව නායකයා අලුත් යුගයක් උදා කිරීම ගැන සඳහන් කළ අතර ඔහු අවධාරණය කළේ වෙහෙස වී වැඩ කිරීමෙන් තොරව ජීවත්විය හැකි එකම රට කියුබාව පමණක් බවය. තම රටේ අකාර්යක්ෂම ආර්ථිකය ප්‍රසිද්ධියේ විවේචනය කළ හෙතෙම කියුබන් විප්ලවයේ ජයග්‍රහණ ආරක්ෂා කර ගැනීමට අපොහොසත්වූයේ නිදහස් සෞඛ්‍ය සේවය, නිදහස් අධ්‍යාපනය, සහන පදනමකින් සියලු පුරවසියන්ට නිවාස සැපයීම හා ආර්ථිකය ප්‍රතිසංස්කරණ නොකිරීම බව ද ප්‍රකාශ කර ඇත.

අදහස් පළ කිරීමෙන් නතර නොවූ හෙතෙම තම ප්‍රතිපත්ති ක්‍රියාවට නගන්නට ද තීන්දු කර තිබේ. කියුබාවේ නව ප්‍රතිසංස්කරණ අනුව පසුගියදා හවානා නුවර පිහිටි කෘෂිකර්ම අමාත්‍යංශයේ සේවකයන් 200 ක් සේවයෙන් පහකරනු ලැබීය. රජය වහාම ලක්ෂ පහක සේවක පිරිසක් රජයේ සේවයෙන් ඉවත් කරන්නට තීරණය කර තිබේ. එය මිලියනයක් හෙවත් කියුබානු රජයේ සේවයෙන් සියයට විස්සක් කපා හැරීම දක්වා ක්‍රියාත්මක වනු බව ප්‍රකාශයට පත්කර තිබේ. මාස පහක වැටුප් සහිතව රජයේ සේවයෙන් ඉවත් කරන අයට අවශ්‍යනම් ආදායම් උපයා ගැනීම උදෙසා තමන්ගේ ව්‍යවසාය ආරම්භ කරන්නට ඉඩ දී තිබේ. මෙතෙක් කල් ආණ්ඩුවට පිටින් රැකියා කරන අවස්ථාව නොතිබිණ. අඩුම තරමින් සී.ඩී. තැටියක් පවා අලෙවි කරන ලද්දේ රජයේ වෙළඳ සැල් වල පමණකි. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයට එපිටින් ව්‍යවසාය පවත්වාගෙන යාමේ නිල ක්‍රමයක් නොපැවති නමුත් විශාල පිරිසක් බදු නොගෙවමින් අක්‍රමවත්ව තම ජීවනෝපාය කරගෙන ගිය බව ද පෙනේ. එවැනි පැවැත්මක් විප්ලවයට විරුද්ධ එකක් සේ සැලකූ නමුත් දැන් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන නිල පුවත්පත ස්වයං රැකියා වශයෙන් නිරත විය හැකි ක්ෂේත්‍ර 175 ක් ප්‍රසිද්ධ කර ඇත. කියුබාවේ පැවති පැරණි ව්‍යුහය වෙනස් කරමින් ව්‍යවසායකත්ව ඇරඹෙන බව නිරීක්ෂණය කළ හැකිය. ජනතාව සිය ව්‍යාපාර අරඹන්නට පටන් ගෙන තිබේ. අද ඔවුන්ගේ හඬ වී ඇත්තේ කියුබානුවන්ට අවස්ථාවක් දෙන්න ඔවුන්ට මුදල් ඉපැයිය හැකිය යන්නය.

ප්‍රකට හා වාමාංශික සංකල්පයේ සුවිශේෂී කේන්ද්‍රස්ථානයක් වූ කියුබාව මෙවැනි පරිවර්තනයකට මුහුණ දෙමින් සිටින අතර මේ අවස්ථාව සසඳන්නට ශ්‍රී ලාංකිකයන්ට ඉඩක් වෙන් කළ යුතුය. ශ්‍රී ලංකාව බටහිර යටත් විජිත ග්‍රහණයෙන් මිදී නිදහස් රටක් බවට පත්ව දැනට දශක හයකට වැඩිය. කිසිදු අවස්ථාවක ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය සම්පූර්ණයෙන්ම ආණ්ඩුව භාරයේ පැවතී නැත. අධිරාජ්‍යවාදීන් උපායශීලී අන්දමට ලාංකිකයන් ව්‍යවසායකයන් බවට පත්වීම වැලැක්වීය. ලබාගත හැකි ඉහලම තත්ත්වය ආණ්ඩුව යටතේ ආණ්ඩුවේ රැකියා කරමින් විසීම බවට ආකල්ප වගා කළහ. නව චින්තකයන්, අලුත් අලුත් දෑ සොයාය යන්නන් අවහිර කර තම රටවල වෙළඳ පොළට අවශ්‍ය දේ නිපදවන ජාතියක් වශයෙන් ලාංකිකයන් කොටු කළහ. ඔවුන් එසේ කළේ ප්‍රාග්ධනය මහජනතාව අතට ගොස් ඔවුන් තීරණ ගත හැකි ස්වාධීන පුද්ගලයන් වීම වැලැක්වීමටය. තමන් යටතේ තමන් කියන දේ කරන අවනත ජාතියකින් අධිරාජ්‍යයට අභියෝග එල්ල නොවෙන බව පාලකයෝ හොඳාකාරව දැන සිටියහ. එම පාලනය කිරීමේ රටාව අපේ ආත්මයට කිඳා බැස තිබේ. අදටත් නිවහල්ව තමන්ගේම ව්‍යවසායයක් අරඹා තමන්ට රිසි පරිදි එය මෙහෙයවනවාට වඩා රජයේ සේවකයෙකු ලෙස වැඩ කිරීම වැදගත්ය යන ආකල්පයක් මහජනතාව තුළ පැවතීම කොතරම් කණගාටුවට කරුණක් විය යුතුද? තමන්ටම ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් අරඹා එය සාර්ථකත්වය කරා ගෙන යාම අභියෝගයකි. එහෙත් එවැනි අභියෝග සාර්ථකව දිනාගත් අවස්ථා අප හමුවේ ඇත.

කියුබානුවන් තමන්ට මුදල් උපයන්නට අවස්ථාවක් දෙන්නැයි ඉල්ලන අතර ලාංකිකයන් විවෘත ආර්ථිකයක් ඇති පසුබිමක උවමනා තරම් ව්‍යවසායකත්ව ඇතිව ආණ්ඩුවේ රැකියා වෙනුවෙන් අරගල කිරීම විශ්මය ජනක එකකි.

විශේෂයෙන් ඉක්මනින් පිබිදෙන සංචාරක ව්‍යාපාරය ගැන අවධානය යොමු කළ හැකිය. දැන් මෙරටට පැමිණෙන සංචාරකයන් වැඩිවෙමින් පවතී. මේ අවුරුද්දේ එම පිරිස ලක්ෂ හයක්

පමණ වනු ඇත. මහින්ද චින්තනය වැඩපිළිවෙල අනුව වසර එය ලක්ෂ විසි පහ දක්වා වැඩි කර ගැනීම රජයේ ඉලක්කයයි. තායිලන්තයට මේ වන විට ඉන්දියාවෙන් පැමිණි සංචාරකයන් ප්‍රමාණය පමණක් දස ලක්ෂය ඉක්මවා ඇතැයි ප්‍රකාශ වී තිබේ. සිංගප්පූරුව, තායිලන්තය, මාලදිවයින, ඉන්දුනීසියාව විශාල සංචාරක ආකර්ශනයක් ඇති රටවල්ය. ඇමරිකාව, බ්‍රිතාන්‍ය පවා සංචාරකයන් ගෙන්වා ගැනීමට වැඩසටහන් සම්පාදනය කරයි. මෙරට සංස්කෘතිය, පරිසරය හා වෙරළ ආශ්‍රිත විවේකය දක්වා වැඩි වැඩියෙන් සංචාරකයන් ආකර්ශනය කරගත හැකිවෙයි. දැනට ලක්ෂ හයක පමණ සංචාරකයන් වෙනුවෙන් බිහිවී ඇති රැකියා ගණන ලක්ෂ විසිපහක සංචාරකයන් පිරිසක් වෙනුවෙන් වැඩිවන විට පහසුවෙන්ම එම ක්ෂේත්‍රය ආශ්‍රිතව රැකියා සිවුගුණයකින් වැඩි කළ හැකිය. සංචාරක හෝටල් ආශ්‍රිතව පමණක් නොව ඉදිකිරීම් හා සංචාරක සේවා සැපයීම් ආශ්‍රිතව ද අතුරු රැකියා බිහිවන විට මෙරට ජනගහනයේ පවතින රැකියා හිඟය පහත වැටෙන්නට ඉඩකඩ තිබේ.

මෙයට අමතරව බස්නාහිර පලාත තුළ ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිතව රැකියා ඇතත් ඒ වෙනුවෙන් ඉදිරිපත්වන්නට තරුණ තරුණියක් ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වන බව පෙනෙන්නට තිබේ. ඇඟලුම් කර්මාන්තය මේ නිසා විශාල ශ්‍රම හිඟයකට මුහුණ පා සිටී. මෙම ප්‍රවනතාවය තවත් පලාත්වලට ව්‍යාප්ත වෙමින් පවතින අතර ඇඟලුම් කම්හල් මෙයට විකල්පයක් වශයෙන් දුර පලාත්වලින් සේවක සේවිකාවන් සොයා ගැනීමට වෙහෙසෙන අතර තවත් කම්හල් වෙනත් පලාත්වලට රැගෙනයාමේ සූදානමක් ද පවතී. දැනට ලැබෙන දත්ත පෙන්වන්නේ අලුතින් මුදාගත් උතුරු නැගෙනහිර ප්‍රදේශ කරා ව්‍යාපාරිකයන්ගේ අවධානය යොමු වී ඇති බවයි. මෙයට අමතරව ශ්‍රමිකයන් ගේ හිඟය හෙයින් ශ්‍රී ලංකාවෙන් පිටත ස්වකීය ආයෝජන සිදුකරන්නට පවා තීරණය කර ඇති ඇඟලුම් කම්හල් ද ඇති බව පෙනෙන්නට තිබේ. මේවා රටට අහිමිවන ආයෝජන අවස්ථාවන්ය. එපමණක් නොවේ. ඇඟලුම් කර්මාන්තයේ පැවති රටාව වෙනස් වීම ඉදිරියේ නවාතැන් හා ප්‍රවාහනය ඇතුලු සමාජ ප්‍රශ්න සේවක සේවිකාවන්ට ඇතිවිය හැකි අතර කර්මාන්ත කරුවන්ට ස්වකීය නිපැයුම් වෙනුවෙන් දරන්නට වෙන වියදම වැඩි වීමෙන් විවිධ ප්‍රශ්න මතුවිය හැකිය. ඇඟලුම් කර්මාන්තයට අමතරව කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය හා තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල ද තියුණු ශ්‍රම හිඟයක් පවතී. මෙයට හේතුව ආකල්ප ගැටලුවකි. රට පුරා රැකියා හිඟයක් ඇතැයි ප්‍රකාශ වෙයි. අධ්‍යාපනය අවසන් කරන සිසුන් රැකියා ඉල්ලා ආණ්ඩුවට විරුද්ධව වීදි බසින බව පෙනේ. එහෙත් රැකියා වෙළඳ පොළේ විවිධ ජීවනෝපාය අවස්ථා ඇතත් තරුණ පරපුර මෙම අවස්ථා වෙනුවෙන් සූදානම් නැත. ඔවුන් ඉල්ලන්නේ විශ්‍රාම වැටුප් සහිත ආණ්ඩුවේ රැකියාය. අධ්‍යාපන සහතිකය ඉදිරිපත්කරන තරුණන් ඉල්ලන්නේ ටයි පටිය ගෙල බඳින කාර්යාලයේ ගැවසෙන ආණ්ඩුවේ ස්ථිර රැකියාය.

රජයට රැකියා බිහි කළ නොහැකිය. කියුබානු අත්දැකීම එය මනා කොට පැහැදිලි කරයි. කියුබාවට කරන්නට නොහැකි වූ දේ ශ්‍රී ලංකාව තේරුම්ගත්තේ දශක දෙක තුනකට කලින් වුවත් ඒ පණිවුඩය සෘජුව සමාජය තේරුම්ගෙන නැත. කාර්යක්ෂමතාවය අඩු නිෂ්පාදනයට දායක නොවන රැකියා බිහි කිරීමෙන් දියුණුවක් සිදු නොවේ. එවැනි වෘත්තීන්ට වැටුප් හා කාර්යාල නඩත්තුවට රජයට දරන්නට සිදුවන වියදම බරපතල එකකි. වර්තමානයේ රජයේ සේවය ලක්ෂ විස්සක පමණ පිරිසකි. එය ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට දරා ගත නොහැකි තරම් විශාල ගණනකි. දැනට රජය ඒ වියදම දරා ගෙන සිටින්නේ මහජනතාවගෙන් බදු අයකරමින් ඒ බදු මුදලින් නඩත්තු කරන රාජ්‍ය සේවයක් පවත්වාගෙන යමින් බව පැහැදිලිය. තව තවත් රාජ්‍ය සේවය වැඩි වීම නැති ප්‍රශ්න උද්ගත කරන්නකි.

අලුත් ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය කරන්නට වත්කම් ආණ්ඩුවට හිඟය. තව දුරටත් ප්‍රසාරණය වන රාජ්‍ය සේවයකින් රටට යහපතක් නොවේ. ආණ්ඩුවේ රස්සාවකින් ගන්නා මාසික වේතනයට වඩා වැඩිපුර ඉපැයිය හැකි අවස්ථා ගැන අප අවධානය යොමු කළ යුතුය. තමන් ම ව්‍යවසායකයෙකු වන ආකාරය ගැන හිතන්නට තරුණන් අවධානය යොමු කළ යුතුය. අධ්‍යාපනය ආණ්ඩුවේ රැකියාවකට සුදුසුකමක් නොවේ. නිසි අධ්‍යාපනය අවසානයේ දැනුමෙන් පොහොසත් පුද්ගලයෙකු බිහිවිය යුතුය. ඔහු සිතන්නටත් ක්‍රියාකරන්නටත් පටන් ගත යුතු අතර ඒ වෙනුවෙන් පහසුකම් සපයන්නට හැකි සමාජ රටාවක් හා පාලන ක්‍රමයක් රටට

අවශ්‍යය. ආදායමක් උපයන්නට ව්‍යවසායයක් අරඹන්නට හැකි තරුණයෙකු රටට ආශිර්වාදයකි. ඔහු යැපෙන්නෙක් නොවේ. රටත් සමාජයේ උපයන්නේ නැති කොටසත් යැපෙන්නේ ඔහුගේ සක්‍රීය භාවය නිසා බව සිතන ආකල්පමය පරිවර්තනයක් රටට අවශ්‍යය. තව දුරටත් රජයේ සේවකයා ගාම්භීර හා තීරණ ගන්නා පුද්ලගයෙකු ලෙස සැලකීම අවශ්‍ය නැත. කාලයක අධිරාජ්‍යවාදීන්ට සමීපවීම නිසා ගෞරවයට පත්වූ ඔහුගේ නීති රීති ක්‍රියාත්මක කළ පුද්ගලයෙකු අනුසාරයෙන් තවමත් බැබලීම වෙනුවට ස්වෝත්සාහයෙන් යමක් නිපදවා, සේවාවක් තුළින් ආදායම් උපදවන්නට වෙහෙසෙන ලාංකීය අලුත් පරම්පරාව ධෛර්යවන්තයන් බවට පත් කළ යුතුය. සමාජය මේ දිරිමත් තරුණන් ආඩම්බරයෙන් දකින්නටත්, ඔවුන්ගේ දහඩිය මහන්සියට නිසි තක්සේරුවක් ලබා දෙන්නටත් තීන්දු කිරීම අවශ්‍යය.

ජාත්‍යන්තර සමාජයේ සිදුවන දෙයින් අවබෝධය ඇති කරගෙන අනාගතයට මුහුණ දිය හැක්කේ එවිටය. කියුබාවේ වෙනස් වෙමින් තිබෙන ආකල්ප මගින් ලබා ගත යුතු පණිවුඩය එයයි.